# ශ්‍රී ලංකා ජාතික සංගමයේ සැකසූ න්‍යාය පත්‍රය බාර දෙමින්



ශ්‍රී ලංකා ජාතික සංගමයේ න්‍යාය පත්‍රය නැදිමාල විශ්ව කෝවිලේ ශිව ශ්‍රී ඊශ්වර කුරුක්කල් තුමා වෙත අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා විසින් පිළිගැන්වූ අයුරු.

සුබවාදී පාලනයක් උදෙසා රජය පොළඹවන හා දිරි ගන්වන කරුණු 12 කින් යුක්තව ශ්‍රී ලංකා ජාතික සංගමය සැකසූ න්‍යාය පත්‍රය එහි නායක සහ අධිකරණ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා විසින් හින්දු ආගමික පූජකවරුන් වෙත වැල්ලවත්ත ශන්මුගම් ශාලාවේදී ඉකුත්දා පිළිගන්වනු ලැබීය.

නැදිමාල විශ්ව කෝවිලේ ශිව ශ්‍රී ඊශ්වර කුරුක්කල්තුමා, කොළඹ දෙමළ සංගමයේ සභාපති පී. කයිලාසිපිල්ලේ සහ එහි ලේකම් කේ. නීලකන්ඩම් මහත්වරුන් මෙන්ම ලංකා කොංග්‍රෂයේ නියෝජිතයන් පිරිසක්ද මෙම අවස්ථාවට සහභාගී වී සිටියහ.

මෙහිදී අදහස් දැක්වූ මිලින්ද මොරගොඩ මහතා පැවසුවේ සියලු දෙනාට සාමයෙන් සමගියෙන් ජීවත්විය හැක්කේ කෙසේද යන්න පිළිබඳව මෙම න්‍යාය පත්‍රයෙහි සඳහන් බවයි.

දරුවනට යහපත් අධ්‍යාපනයක් ලබා දිය යුතු බවත් උසස් අධ්‍යාපනය වෙනුවෙන් අන්තර් උසස් ආගමික අධ්‍යාපන ආයතන පිහිටුවීම පිළිබඳව සොයා බැලිය යුතු බවත් මෙහිදී මිලින්ද මොරගොඩ මහතා කීය. සිය ආගමික හා අධ්‍යාපන කටයුතුවල නිරත වීමට දෙමළ ජනතාවට පවතින බාධක හඳුනාගෙන ඒවාට පිළියම් යෙදිය යුතු බවද මොරගොඩ මහතා මෙහිදී අවධාරණය කළේය.

(අංජුල මහික)